# අධ්‍යාපන අමාත්‍යාංශය

## පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

### 8 වන බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

### 2020/ 2021/ 2022 වර්ෂ වලදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් සිසුන් සඳහා

IFSLS

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශය මගින්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් උදෙසා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (IFSLS) ක්‍රියාත්මක කරනු ලබයි.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් මෙහෙයවනු ලබන තෝරාගත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මෙමඟින් අවස්ථාව සලසනු ලබයි.

tamilguru.lk

#### අයදුම්පත් ඉදිරිපත් කිරීම

සුදුසුකම්ලත් අපේක්ෂකයින් www.studentloans.mohe.gov.lk මගින් මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

#### උපාධි පාඨමාලා

සියලුම උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවනු ලබන අතර, www.studentloans.mohe.gov.lk වෙබ් අඩවියෙහි පළකොට ඇති ශිෂ්‍ය අත්පොත මගින් අදාල උපාධි පාඨමාලා ලැයිස්තුවට යොමුවිය හැක.

#### අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය

ආරම්භක දිනය : 2024.09.09
අවසන් දිනය : 2024.10.20

#### සුදුසුකම්

i. 2020/ 2021/ 2022 වර්ෂ වලදී අ.පො.ස. (උ/පෙළ) විභාගයට අනුමත විෂයයන් 3ක් සඳහා තෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 3ක් එක්වර ලබා තිබීම **සහ**
ii. ඉහත (i) හි විස්තර කොට ඇති ඕනෑම වරකදී සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම. **සහ**
iii. අ.පො.ස. (උ/පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම. **සහ**
iv. අයදුම්කරුවන්ගේ වයස 2024.10.20 වන දිනට අවුරුදු 26 හෝ ඊට අඩුවීම.

#### වෙනත් සුදුසුකම්

උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමේ අනෙකුත් සුදුසුකම් දැන ගැනීමට www.studentloans.mohe.gov.lk හි ශිෂ්‍ය අත්පොත පරිශීලනය කරන්න.

#### තෝරා ගැනීමේ නිර්ණායකයන්

අදාළ පාඨමාලා සඳහා බඳවා ගැනීම පහත සඳහන් කරුණු මත පදනම් වේ.
i. අයදුම්කරු විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම්.
ii. උපාධි පාඨමාලා සඳහා අයදුම්කරුවන් විසින් සඳහන් කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙල.
iii. අදාල රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් එක් එක් උපාධි පාඨමාලා සඳහා ප්‍රදානය කොට ඇති ආසන ධාරිතාව.
iv. ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව අදාල ආයතනයේ එක් එක් උපාධි පාඨමාලාව සඳහා වන ආසන ධාරිතාවය ඉක්මවා යන විටදී අයදුම්කරුවන් අ.පො.ස. (උ/ පෙළ) විභාගයේදී ලබාගත් Z අගය මත තේරීම් සිදු කෙරේ.

#### උපරිම ණය ප්‍රමාණයන් රු.1,500,000.00

උපාධි පාඨමාලා සඳහා ලබා දෙනු ලබන උපරිම ණය මුදල විෂය ධාරාව අනුව තීරණය වී ඇත. උපරිම ණය සීමාවන් දැන ගැනීමට www.studentloans.mohe.gov.lk වෙත පිවිස ශිෂ්‍ය අත්පොත පරිශීලනය කරන්න. එම ණය සීමාව යටතේ පාඨමාලාව සම්පූර්ණයෙන් හදාරා අවසන් කිරීමට හැකියාව පවතී. මීට අමතරව ශිෂ්‍යයාගේ කැමැත්ත මත වසරකට රු.75,000ක ශිෂ්‍යාධාර ණය මුදලක්ද පොලී රහිතව ලබා ගත හැක.

#### වැඩි විස්තර සඳහා අමතන්න

ශිෂ්‍ය ණය අංශය
රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය, අංක 980/4A,
වික්‍රමසිංහ පෙදෙස,
ඇතුල්කෝට්ටේ.

E: dsls@mohe.gov.lk
w : www.mohe.gov.lk
T : 070 3555 970/979
F: 0112-879 719

#### ණය නිකුත් කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරාගන්නා ලද සිසුන් ණය ලබා දීමට සුදුසු බවට බැංකුව වෙත නිර්දේශ කරන අතර, සිසුන් තම ණය අයදුම්පත්, ඇපකරුවන් දෙදෙනෙකු සමග අදාල බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඇපකරුවන් දෙදෙනාගෙන් පළමු ඇපකරු මව/පියා හෝ භාරකරු වන අතර දෙවන ඇපකරු බැංකුව විසින් ඉල්ලුම් කරන ආදයම් සහිත අයෙකු විය යුතුය.
ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන පරිදි සමාසික වශයෙන් පාඨමාලා ගාස්තු සඳහා ගෙවීම් කරනු ලබයි.

#### ශිෂ්‍ය වගකීම්

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන සියලුම සිසුන් උපාධි පාඨමාලාවේ සෑම අනිවාර්යය විෂයයක් සඳහාම අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) පාඨමාලා කාලසීමාව තුළ ලබාගත යුතු අතර, ඔවුන්ගේ අධ්‍යයන කාලය තුළ 80% පැමිණීම පවත්වා ගත යුතුය

#### ණය ආපසු ගෙවීම

සම්පූර්ණ ණය කාලසීමාව වසර 12 කි. ඒ සඳහා වන සම්පූර්ණ පොලිය රජය විසින් ගෙවනු ලබයි. අධ්‍යයන කාලසීමාව හා එක් වසරක සහන කාලයකට පසුව, ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.
වසර 4 / 3 පාඨමාලාවන් සඳහා වූ සම්පූර්ණ ණය මුදල පිළිවෙලින් වාරික 84 / 96කින් ගෙවා අවසන් කළ යුතුයි.

#### පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ 8වන බඳවා ගැනීමට අදාළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

SLIIT, NSBM Green University Town, CINEC Campus, SIBA Campus, CA Sri Lanka, ICBT Campus, SCL, Institute of Chemistry Ceylon, Horizon Campus, KIU, BMS, SLTC, Saegis Campus, Esoft Metro Campus, RIC, BCI Campus, Aquinas College of Higher Studies, NIIBS